Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

කොළඹ, 2022 සැප්තැම්බර් 19

## නෙස්ලේ ලංකා බෙදාහැරීම් මධ්‍යස්ථානය දින 4,000ක සුරක්ෂිත මෙහෙයුම් සම්පූර්ණ කරයි

සිය සේවක කාර්යමණ්ඩලය සහ ඔවුන්ගේ සුරක්ෂිතතාව පිළිබඳ තමන් සතු දැඩි කැපවීම තහවුරු කරමින්, දින 4,000ක සුරක්ෂිත මෙහෙයුම් සම්පූර්ණ කිරීමට නෙස්ලේ ලංකා බෙදාහැරීම් මධ්‍යස්ථානය පසුගියදා සමත්විය. කුරුණෑගල පිහිටි මෙම බෙදාහැරීම් මධ්‍යස්ථානය මගින් දිවයින පුරා නෙස්ලේ නිෂ්පාදන බෙදාහැරීම් කටයුතු සහ නිෂ්පාදන ගබඩාකිරීම සිදුකරන අතර, එහි 150කට වැඩි සේවක පිරිසක් සේවයේ යෙදී සිටියි. එහි, ප්‍රවාහන විසඳුම් සහකරු ලෙස EFL 3PL ආයතනය ක්‍රියාකරයි.

මෙම සුවිශේෂී කඩයිම සමරනු වස් 2022 අගෝස්තු 30 දින නෙස්ලේ ලංකා බෙදාහැරීම් මධ්‍යස්ථානයේදී විශේෂ උත්සවයක් ද සංවිධානය කර තිබුණි. එම අවස්ථාවට, කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා, නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනයා, නෙස්ලේ ලංකා උප සභාපති - සැපයුම් දාම, පංචාද්වරම් සතියේන්ද්‍ර සහ EFL 3PL ප්‍රධාන විධායක නිලධාරී සැමී අක්බාර් යන මහත්වරු ඇතුළු නෙස්ලේ ලංකා සහ EFL 3PL ආයතනවල සාමාජිකයෝ එක්ව සිටියහ. මෙම උත්සවය දැඩි සුරක්ෂිතතා මාර්ගෝපදේශවලට යටත්ව සංවිධානය කර තිබුණි.

"අපගේ බෙදාහැරීම් මධ්‍යස්ථානය දින 4,000ක සුරක්ෂිත මෙහෙයුම් සම්පූර්ණ කරනු ලබන මෙම අවස්ථාව සැමරීමට හැකිවීම අපට විශාල සතුටක්. අපගේ ව්‍යාපාරයේ කේන්ද්‍රය වන්නේ අපගේ සේවක කාර්යමණ්ඩලයයි. එබැවින් ආරක්ෂාව යනු නෙස්ලේහි අනිවාර්ය ප්‍රමුඛතාවක්. රැකියා ස්ථානයේදී ස්වකීය සුරක්ෂිතතාව සලසා ගනිමින් සහ සුරක්ෂිතතා ප්‍රමිතීන්ට අනුකූලව වගකීම් සහගත ලෙස ක්‍රියාකළ සේවක කාර්යමණ්ඩලයට ප්‍රශංසා කිරීමටත් මෙය අවස්ථාවක් කරගැනීමට මා කැමතියි. එමෙන්ම, අප වර්තමානයේ මුහුණ දෙන විවිධ අභියෝග හමුවේ අපගේ ව්‍යාපාර මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට බෙදාහැරීම් මධ්‍යස්ථානය මගින් සිදුකරන කාර්යභාරය ඇගයීමටත් මා කැමතියි", යනුවෙන් උත්සව සභාව අමතමින් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනයා මහතා පැවසීය.

"අප හා සමාන වටිනාකම්වලින් යුතු සමාගමක් හා එක්ව කටයුතු කිරීමට ලැබීම විශාල භාග්‍යයක්. EFL 3PL ආයතනය තුළත් අපගේ ප්‍රමුඛතාව වන්නේ සේවක සුරක්ෂිතතාවයි. නෙස්ලේ සතු දැඩි සුරක්ෂිතතා මාර්ගෝපදේශ හේතුවෙන් අපගේ සේවකයින්ටත් සෑම දිනකම සුරක්ෂිත රාජකාරි පරිසරයක් ලබාදීමට අපට හැකිවුණා. නෙස්ලේ සමාගම සමඟ අපගේ සබඳතාව තවදුරටත් ශක්තිමත් කරගනිමින් එකට එක්ව තවත් ජයග්‍රහණ සහ කඩයිම් ළඟාකරගැනීමට අපි බලාපොරොත්තු වෙනවා", යනුවෙන් EFL 3PL ප්‍රධාන විධායක නිලධාරී සැමී අක්බාර් මහතා ප්‍රකාශ කළේය.

මෙම අවස්ථාවට සහභාගී වූ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා මහතා ද වසර 115කට අධික කාලයක් පුරා ශ්‍රී ලංකාව තුළ නෙස්ලේ ලංකා සමාගමේ ගමන්මඟ පිළිබඳවත්, රටේ සමාජ ආර්ථික සංවර්ධනයට සමාගම මගින් ලැබුණු දායකත්වය පිළිබඳවත් සිය අදහස් පළකළේය. "කුරුණෑගලම ඉපදී කුරුණෑගලම හැදී වැඩුණු පුද්ගලයෙක් වශයෙන්, නෙස්ලේ ලංකා කර්මාන්තශාලාව කුරුණෑගල පන්නල ප්‍රදේශයේ පිහිටුවීම පිළිබඳව මම බොහෝ සේ සතුටු වෙනවා. නෙස්ලේ සමාගමේ අඛණ්ඩ ආයෝජන සහ රැකියා සම්පාදනය තුළින් මෙම ප්‍රදේශය තුළ විශාල ප්‍රජා සංවර්ධනයක් දක්නට ලැබෙනවා. අනෙක් අතට, ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙක්

නෙස්ලේ නිෂ්පාදන පාරිභෝගිකයින්. එවන් පසුබිමක, සිය සේවකයින්ගේ සුරක්ෂිතතාව සහ යහපැවැත්ම තහවුරු කරන අතරේ, පාරිභෝගිකයින් උදෙසා උසස් තත්ත්වයේ නිෂ්පාදන ලබාදීමට නෙස්ලේ ලංකා සමාගමත්, EFL 3PL සමාගමත් දරන පරිශ්‍රමය ඇගයීමටත් මා මෙය අවස්ථාවක් කරගන්නවා", ඔහු පැවසුවේය.

තව ද, මෙහිදී නෙස්ලේ ලංකා සමාගම සහ EFL 3PL සමාගම උපරිම සුරක්ෂිතතාවක් උදෙසා ඇති කැපවීම තවදුරටත් තහවුරු කරවමින් එම සමාගම්හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් විශේෂ ප්‍රතිඥාවකට ද අත්සන් තැබිණි. අනතුරුව උත්සව සභාවට එක්ව සිටි පිරිස එම ප්‍රතිඥාව කියැවූ අතර, රැකියා ස්ථානය තුළදී ස්වකීය සුරක්ෂිතතාව සම්බන්ධයෙන් තමන්ට ඇති වගකීම් ඒ හරහා ඔවුන්ට යළිත් සිහිපත් කෙරුණි. ඊට අමතරව, සේවකයින්ගේ දරුවන් වෙනුවෙන් චිත්‍ර තරඟයක් ද මෙහිදී සංවිධානය කෙරුණි. සුරක්ෂිතතාව යන සංකල්පය දරුවන්ගේ අවබෝධය හරහා චිත්‍රයට නැඟීම එහි අරමුණ විය. රැකියාවේදී උපරිම සුරක්ෂිතතා ප්‍රමිතීන් අනුගමනය කළ සේවකයින්ට සම්මාන පිරිනැමීමක් ද එහිදී සිදුවිය. වගකීම් සහගත චර්යාව සහ සුරක්ෂිතතා සේවා සංස්කෘතියක් කෙරෙහි සේවක යොමුවීම ධෛර්යමත් කිරීම එහි අපේක්ෂාව විය.

'වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ' අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, ඉහළ ගුණාත්මකබවින් යුතු සිය ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත. 1906 වසරේ පටන් ශ්‍රී ලංකාව තුළ සිය මෙහෙයුම් සිදුකරන නෙස්ලේ සමාගම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට බද්ධ වී ඇත. එමෙන්ම 25,000කට වැඩි ශ්‍රී ලාංකික කිරි සහ පොල් ගොවීන් සහ ගෙවතු වගාකරුවන්ගේ ජීවනෝපාය සංවර්ධනයට දායකවන නෙස්ලේ ලංකා සමාගමේ සෘජු රැකියා නියුක්තිකයින්ගේ සංඛ්‍යාව 800 ඉක්මවයි. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් අති නවීන කර්මාන්තශාලාවේ දැඩි සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි.

ඡායාරූපය: සම්මාන උළෙලේ ජයග්‍රාහකයින් (වමේ සිට දකුණට) නෙස්ලේ ලංකා ජ්‍යෙෂ්ඨ කළමනාකරු - සැපයුම්, දිනේෂ් ද සිල්වා; නෙස්ලේ ලංකා උප සභාපති - සැපයුම් දාම, පංචාද්වරම් සතියේන්ද්‍ර; පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපා, නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනා; EFL 3PL ප්‍රධාන විධායක නිලධාරී සැමී අක්බාර් යන මහත්වරු

---

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |